# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல: 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)

*web : www.elections.gov.lk* *e-mail : info@slelections.gov.lk*

මගේ අංකය : FE/111/2019 ඔබේ අංකය : දිනය : 2019.11.21
எனது இல. : உமது இல. : துகதி :

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යාවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු,
කොමිෂන් සභා ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

## ජනාධිපතිවරණය - 2019.11.16
## මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්.

උක්ත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද අංක FE/111/2019 හා 2019.1120 දිනැති 2019/04 අංක දරණ මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් චක්‍රලේඛයේ 7.1 හා 7.5 වගන්ති පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දන්වමි.

7.1 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරිවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | ගෙවිය යුතු දීමනාව | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා | රු. 4,500.00 | CE 46 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා ✸ | රු. 4,500.00 | CE 19/1 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | රු. 3,750.00 | CE 19 |
| විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | රු. 2,600.00 | CE 19 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්/ ලිපිකරුවන් සඳහා | රු. 2,400.00 | CE 19 |
| කාර්යාල කාර්ය සහායකයින් සඳහා | රු. 2,000.00 | CE 19 |

7.5 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ (ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් සඳහාPRE-6 ආකෘතියේ වූ පත්වීමකට) ඡන්ද ගණන් කිරිමේ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| **කාර්ය මණ්ඩලය** | **දීමනාව රු.** | **පැමිණීමේ සහතිකයේ අංකය** |
|---|---|---|
| ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි | 8,000.00 | CE 50 |
| නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරිමේ නිලධාරි | 5,400.00 | CE 54 |
| සහකාර තේරීම්භාර නිලධාරි | 5,000.00 | CE 49 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ✸ | 4,300.00 | CE 49 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 3,600.00 | CE 49 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති /ලිපිකරු | 2,900.00 | CE 49 |
| කාර්යාල කාර්ය සහායක | 1,900.00 | CE 49 |

02. තවද, 2019.11.20 දිනැති 2019/04 අංක දරණ මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් චක්‍රලේඛයේ සෙසු වගන්ති නොවෙනස්ව ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව

පිටපත් :

1. විගණකාධිපති
2. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
3. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්

} දැන ගැනීම පිණිස හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව ගෙවීම් කිරීම සඳහා



සභාපති
தவிசாளர்

දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல்: 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

ප්‍රධාන මූල්‍ය නිලධාරී
பிரதமகணக்காளர்

දුරකථන/தொலைபேசி: 011-2868449
ෆැක්ස්/தொலைநகல் : 011-2868449
*e-mail : finance@slelections.gov.lk*

ගණකාධිකාරී (ගෙවීම්)
கணக்காளர் (கொடுப்பனவு)

දුරකථන/தொலைபேசி: 011-2886805
ෆැක්ස්/தொலைநகல் : 011-2886805